# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.30 පැය 2210 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1965 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**“රටම එකට” ජාතික මෙහෙයුම ක්‍රියාත්මක කිරීමට සමගාමීව දැනුවත් කිරීමේ ස්ටිකර් ඇලවීම - පොලිස් මූලස්ථානය.**

ජාතික ව්‍යසනයක් බවට පත්ව ඇති විෂ මත්ද්‍රව්‍ය උවදුරින් ශ්‍රී ලංකා සමාජය මුදවා ගැනීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත “රටම එකට” ජාතික මෙහෙයුම දියත් කිරීමේ සමාරම්භක උත්සවය ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2025.10.30 වන අද දින පෙරවරුවේ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.

මත්ද්‍රව්‍ය සැපයුම අඩාල කිරීම, මත්ද්‍රව්‍ය වලට ඇති ඉල්ලුම අවම කිරීම, මෙහෙයුම් පුළුල් කිරීම, ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම, මත්ද්‍රව්‍ය දුර්භාවිතය වැලැක්වීම අරමුණු කරගත් නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මත්ද්‍රව්‍ය වලට එරෙහිව ප්‍රජාව බලගැන්වීම, බහුවිධ ප්‍රවේශයන් මගින් රට තුල ව්‍යාප්තව පවතින මත්ද්‍රව්‍ය ජාවාරම සහමුලින්ම මැඩපැවැත්වීම මෙම ජාතික මෙහෙයුමේ ප්‍රමුඛතම අරමුණ වී ඇත.

මෙම ජාතික මෙහෙයුම ක්‍රියාත්මක කිරීමේ සමාරම්භක උත්සවයට සමගාමීව මහජනතාව දැනුවත් කිරීම සඳහා 2025.10.30 වන අද දින බස්නාහිර පළාත කේන්ද්‍ර කර ගනිමින් පොලිසිය විසින් ත්‍රීරෝද රථවල ස්ටිකර් ඇලවීමක් සිදු කරන ලදී.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්




SURANJITH MO
GO THE DISTANCE
Sri Lanka
POLICE


RAMRU SUPER LINE
Sri Lanka
POLICE


Sri Lanka
POLICE


Sri Lanka
POLICE







පොලිස් මාධ්‍ය කොට්ඨාසය.